| | | | | |
|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | ) 0112669192 , 0112675011<br>) 0112698507 , 0112694033<br>) 0112675449 , 0112675280 | | මගේඅංකය<br>எனது இல<br>My No. | )<br>)NA/06/T/10/2017<br>) |
| ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | ) 0112693866<br>) 0112693869<br>)0112692913 | | ඔබේඅංකය<br>உமது இல<br>Your No. : | )<br>)<br>) |
| විද්‍යුත් තැපෑ,<br>மின்னஞ்சல் முகவரி<br>e-mail | )postmaster@health.gov.lk<br>)<br>) | සුවසිරිපාය | දිනය<br>திகதி<br>Date | )<br>)2019.01.08<br>) |
| වෙබ්අඩවිය<br>இணையத்தளம்<br>website | ) www.health.gov.lk<br>)<br>) | SUWASIRIPAYA | | |

# සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medicine


නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් , ශ්‍රී ලංකා ජාතික රෝහල.
ශික්ෂණ රෝහල්/මහ රෝහල් /අධ්‍යක්ෂවරුන් ,
මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරීන් ,
ඇතුළු සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

**<u>හෙද/හෙදි නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු 2017 /පළාත් රාජ්‍ය සේවයට ස්ථිරව මුදා හැරීම.</u>**

හෙද/හෙදි නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ලබා දීමට අදාළව නිකුත් කරන ලද අංක 01-40-2017 හා 2017.07.28 දිනැති ස්ථාන මාරු චක්‍රලේඛය හා බැඳේ.

02. ඒ අනුව ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන ලද හෙද නිලධාරීන් අතරින් මාරු මණ්ඩලය හරහා ස්ථාන මාරු නිර්දේශ වී ඇති හෙද නිලධාරීන්ගේ හා නිර්දේශ වී නොමැති නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් නාම ලේඛනය මේ සමඟ වේ. මෙම නිලධාරීන් අතුරින් වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය 2016.12.31 දිනට වසර හතරක (04)ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ට හා අපේක්ෂා රෝහල, අංගොඩ මූලික රෝහල,ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය හා වැලිසර ළය රෝහල යන සේවා ස්ථාන වල 2016.12.31 දිනට වසර දෙකක(02) සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ට මුල් පත්වීම් දිනට ජ්‍යෙෂ්ඨතාවය සලකා ස්ථාන මාරු නිර්දේශ ලබා දී ඇත.

03. එසේම 2016 වාර්ෂික ස්ථාන මාරු ලේඛනයේ හෝ ඊට පෙර වර්ෂවල වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා තිබෙන එසේ වුවද මීට පෙර අනුප්‍රාප්තිකයින් ඉල්ලා ස්ථාන මාරු මත වාර්තා කරන සේවා ස්ථානයේ පුරප්පාඩු නොමැති වීම මත අනුප්‍රාප්තිකයින් ලබා නොදුන් නිලධාරීන්ගේ නම් මෙම ලේඛනයට ඇතුලත් කර ඇත. ඒ අනුව 2017 වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයට පෙර නිකුත් කරන ලද ස්ථාන මාරු චක්‍රලේඛවලට අනුව මෙතෙක් ක්‍රියාත්මක වී නොමැති නිලධාරීන්ගේ ස්ථාන මාරු නියෝග 2018.11.30 දිනෙන් පසුව අවලංගු කර ඇති අතර මින් ඉදිරියට 2017 වාර්ෂික ස්ථාන මාරු ලේඛනයේ නම් සඳහන් නිලධාරීන්ට පමණක් අනුප්‍රාප්තිකයින් ලබා දීමට නියමිත බව කාරුණිකව දන්වා සිටිමි.

04. එමෙන්ම 2014 ඒ කණ්ඩායමෙන් අනුප්‍රාප්තිකයින් ලබා දී මගේ අංක **NA/**02/01/2018 වෙළුම 01 හා 2018.06.13 දිනැති ලිපියෙන් ස්ථාන මාරු මත මුදා හරින ලෙසට දන්වා ඇති නිලධාරීන් අතරින් පලාත් එකඟතා නොලැබීම හේතුවෙන් මේ වනතෙක් මුදා හැර නොමැති නිලධාරීන්ගේ ස්ථානමාරු අවලංගු කර නොමැති අතර අදාල නිලධාරීන් සඳහා පලාත් එකඟතා ලද පසු ඔවුන් මුදා හැරීමට කටයුතු කරන මෙන් දන්වමි.

05. මෙම ස්ථාන මාරු ලේඛනයේ නිර්දේශය යටතේ **"නිර්දේශ කරමු"** ලෙස සඳහන් කර ඇත්තේ ස්ථාන මාරු ලබා දීමට ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශය ලැබී ඇති නිලධාරීන්ට වන අතර **"පළාත් අනුමැතියට යටත්ව නිර්දේශ කරමු"**ලෙස සඳහන් ව ඇති නිලධාරීන් සඳහා පළාත් එකඟතාව ලද පසු අදාල නිලධාරීන් පලාත් සභා වෙත ස්ථිරව මුදා හැරීමට නියමිතය. එසේම

පලාත් අනුමැතිය නොලැබුණහොත් එම ස්ථාන මාරු අවලංගු කිරීමට සිදුවන බව ද කාරුණිකව දන්වමි.

06. මෙහිදී සේවා කාලය පිළිබඳ තොරතුරු ලබා ගන්නා ලද්දේ අදාල නිලධාරීන්ගේ ස්ථාන මාරු අයදුම්පත් වලින් වන බැවින් එම අයදුම්පත්වල සඳහන් තොරතුරු ව්‍යාජ/අසත්‍ය බව පසුව හෙළිදරව් වුවුහොත් එම තොරතුරු සපයන ලද නිලධාරීන්ට විනයානුකූලව කටයුතු කරන බවට දන්වා සිටින අතර එවැනි වැරදි තොරතුරු මත ලබාදෙන ස්ථානමාරු අවලංගු කිරීමටද කටයුතු කෙරේ. එවැනි තොරතුරු මත ස්ථාන මාරු අයදුම්පත් සහතික කල නිලධාරීන් ද ඒ සඳහා වගකිව යුතු වේ.

07. රෝහල්වල සේවා සැපයීම අඩාල නොවන සේ මාරුවීම්/පළාත් රාජ්‍ය සේවය සඳහා ස්ථිරවම නිලධාරීන් මුදා හැරීම සිදු කල යුතු අතර ආයතනයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියාට ප්‍රමුඛතාව දෙන ආකාරයෙන් නිදහස් කිරීම යෝග්‍ය වේ. ආයතනයන්ට අදාල කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා දී ඇති සංඛ්‍යාවට අනුකූලව ඔබ ආයතනයේ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යන ලෙස මෙයින් ඔබට දැනුම් දෙමි.

08. ස්ථාන මාරු නියෝග අඩංගු ලේඛනය සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි (**www.health.gov.lk**) පළ කරනු ලබන අතර, ස්ථාන මාරු සම්බන්ධ තීරණය පෞද්ගලිකව කිසිම නිලධාරියකුට දැනුම් දෙනු නොලැබේ. මේ සම්බන්ධව ඔබ ආයතනයේ සියළුම නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

09. මෙම ස්ථාන මාරු නියෝග 2019.01.08 දින සිට බලාත්මක වේ.

ඒ.එම්.කේ.කේ. අත්තනායක
අතිරේක ලේකම් ( පාලන) 02
ලේකම් වෙනුවට
සෞඛ්‍ය ,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

ඒ. එම්. කේ. කේ. අත්තනායක
අතිරේක ලේකම් (පාලන) II
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

385, පූජ්‍යබද්දේගමවිමලවංශහිමිමාවත, කොළඹ 10. 385,வணக்கத்துக்குரியபத்தேகமவிமலவங்சதேரோமாவத்தை,கொழும்பு 10.
385, Rev. BaddegamaWimalawansaTheroMawatha, Colombo 10, Sri Lanka.